**උකුවෙල ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උකුවෙල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තු කර ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ රු.3,582,506 ක මුද්දර ගාස්තු ආදායමින් සමාලෝචිත වර්ෂය තුළ රු.3,105,250 ක් ලැබී තිබුණි. ඒ අනුව පෙර වර්ෂයේදී වැඩිපුර ඇස්තමේන්තු කර ගිණුම්ගත කරන ලද රු.477,256 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා සමුච්චිත අරමුදල හා ලැබියයුතු ආදායම් ගිණුම පිළිවෙලින් හර හා බැර කළ යුතු වුවත්, එම වටිනාකම වෙනුවට රු.2,232,064 ක් ලැබියයුතු ආදායම් ගිණුමට හා සමච්චිත අරමුදලට පිළිවෙලින් හරට හා බැරට ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.2,709,320 කින් ලැබිය යුතු ආදායම් ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම වැඩිපුර දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සභාව සතු එකතුව පර්චස් 131.44 ක් වූ ඉඩම් 4 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| වි ගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.36,079,878 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළ උප ලේඛනවල ශේෂයන්ගේ එකතුව රු. 35,328,365 ක් වූයෙන් රු. 868,145 ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

**1.6.3 අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 154(1) වගන්තිය | ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලද ඉඩම් දෙකක විකුණුම් වටිනාකමින් සියයට 1 ක බදු මුදලක් අයකරගත යුතු වුවත්, ඉඩම්වල රු.64,736,700 ක ඇස්තමේන්තු වටිනාකමින් සියයට 1 ක් ගණනය කර රු.647,367 ක් අයකර තිබුණි. විකුණන ලද ඉඩම්වල විකුණුම් වටිනාකම හඳුනාගෙන ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | ඉතිරි මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.33,184,252 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.25,910,046 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දේපල 20 කින් අයවියයුතු වරිපනම් රු.82,895 ක්, කඩ කාමර 4 කින් රු.63,140 ක කඩ කාමර කුලී හා ත්‍රීරෝද රථ 322 කින් ත්‍රීරෝද නැවතුම් ගාස්තු රු.193,200 ක මුදලක් වර්ෂයකට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.3,785,955 ක් හා මුද්දර ගාස්තු රු.27,738,451 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තවීම හේතුවෙන් රජය විසින් පනවා ඇති ඇඳිරිනීති තත්ත්වය නිසා උකුවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පීඩාවට පත් ජනතාවට සහන මිලට එළවළු හා පළතුරු සැපයීම වෙනුවෙන් අදාල ගෙවීම් වවුචරය අනුමත කිරීමකින් තොරව සභාපතිවරයා විසින්ම රු.150,000 ක අත්තිකාරමක් ලබාගෙන සභාවේ සභිකවරයෙකුට ලබාදී තිබුණි. අත්තිකාරම් මුදල යොදවා එළවළු හා පළතුරු මිලදී ගැනීම හා පීඩාවට පත් ජනතාවට සහන මිලට එළවළු හා පළතුරු බෙදා හැරි බවට කිසිදු ලේඛනගත සාක්ෂියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම අත්තිකාරම් මුදල් අවිධිමත් ලෙස ලබාගෙන 2020 අප්‍රේල් 01 සිට 19 දින දක්වා සභාවේ ලොරි රථයක් හා සේවකයින් යොදවා වෙනත් ප්‍රදේශවලින් එළවළු , පළතුරු ගෙන්වා නගරය අවට වෙළඳාම් සිදුකර තිබුණි. එමෙන්ම මේ සඳහා රු.21,726 ක ඉන්ධන වියදම් ද දරා තිබුණි.

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හි විධිවිධානවලට පරිභාහිරව කටයුතු කර අත්මිල ගණන් ලබාගෙන රු.165,996 ක් වටිනා ක්‍රීඩා උපකරණ මිලදීගෙන තිබුණි. එම ක්‍රීඩා උපකරණ වලින් හෝම්ජිම් කට්ටලයක් හා ඩම්බ් බෙල් 4 ක් සඳහා ලබාදී තිබුණු අඩුම මිල ගණන් වූ රු.36,725 ක් සහිත මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයකින් රු.62,230 කට මිලදීගෙන රු.25,505 ක අලාභයන් සිදුකර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා බව. | නීති, රීති හා රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතු වීම. |